සන්නස පුවත්පත වෙනුවෙන් වත්සලා ඉෂ්ටවීර, කුසුම්සිරි ලියනආරච්චි සමග

# “ටියුෂන් මැජික්” නාට්‍ය නිර්මාණය පාදක කෝටගෙන කළ කතාබහ

වත්සලා ඉෂ්ඨවීර



අධ්‍යාපන මනෝවිද්‍යාවට අනුව, අධ්‍යාපන ක්‍රමවේද ඔස්සේ ළමා මනසට ප්‍රවිශ්ඨ වීමත්, ඒ තුළින් ඔවුන්ගේ අවබෝධය පුළුල් කිරීමත්, උසස් රසවින්දනයකට අවශ්‍ය මාර්ගය විවර කිරීමත්, සාමූහිකව කටයුතු කිරීමට දරුවන් හුර කරවීමත්, ඒ සියල්ල තුළින් යහපත් සමාජයක් බිහි කිරීමත්, සාමාන්‍ය කෙනෙකුට එක්තරා ආකරයකින් අභියොගයක් විය හැකියි. එවන් අභියෝග යකට සාර්ථකව මුහුණ දෙමින් වසර ගණනාවක් දේශීය ළමා නාට්‍ය කෙත පෝෂණය කළ යසෝධරා සරච්චන්ද්‍ර සහ කුසුම්සිරි ලියනආරච්චි දෙපලගේ නවතම නාට්‍ය නිර්මාණය “ටියුෂන් මැජික්” නමින් අගෝස්තු මස 3,10 සහ 17 තෙදින තුළ දී මෙල්බර්න් නුවර වේදිකාගත වීමට සියල්ල සූදානම්. යුහුසුළුව පුහුණු කටයුතුවල යෙදෙන අතරවාරයේ දී එහි නිර්මාපකයා, කුසුම්සිරි, සමග සුළු වේලාවක් කතාබහේ යෙදෙන්නට මට හැකි වුනා. වරින්වර ඈතින් ඇසෙන මිහිරි ගීත නද මා මන මත් කරද්දී අපේ කතාබහ මෙසේ ආරම්භ කළා.

**වත්සලා : ප්‍රශ්ණය**

වසර 10 කට වඩා වැඩි කාලයක් මෙල්බර්න් ළමා පරපුර වෙනුවෙන් ඔබත් යශෝදරාත් විවිධ මාතෘකා ඔස්සේ වේදිකාව නිර්මාණය



කළා. ඒ බොහොමයක මා දුටු යම් විශේෂත් වයක් තිබුනා. ඒ දරුවන්ගේ ලෝකයට එබිකම් කරන්නට ඔබ විවිධ ආකෘති යොදා ගැනීම. උදාහරණයක් ලෙස, සිංහල ජන කතා සහ ඒ ඒ චරිත, සුන්දර සතුන් වගේ දේවල්. නමුත්, මෑතක දී එහි යම් වෙනසක් දකින්නට ලැබුනා. හුදෙක්ම, දරුවා තුළින් දරුවන්ටම ලං වීම වෙනුවට, දරුවා තුළින් වැඩිහිටි මනසට යම් පණිවිඩයක් ලබා දීමට ඔබේ නිර්මාණ ඔබ යොදා ගත්තා කියලා මට හිතෙනවා. මම හරිද?

**කුසුම්සිරි : පිළිතුර**

වත්සලා, ඔබේ ප්‍රශ්ණයට සවිස්තර පිළිතුරකට මුලපුරනවානම් මට මීට වසර 24 කට පෙර මතකයන් අවදිකරන්න වෙනවා. මගේ ජීවිත කාලේ ලංකාව තුළ පළමු වරට ජාතික/රාජ්‍ය ළමා නාට්‍ය උළෙලක් පවත් වන්නේ 1996 වසරේදි. නාට්‍ය ක්ෂේත්‍රයට විවිධ ආකාරයෙන් අවතීර්ණය වෙමින් හිටි මම මගේ ප්‍රථම ප්‍රසිද්ද වේදිකා නාට්‍ය නිර්මාණය ළමා නාට්‍ය නිර්මාණයක් ලෙසින් එළිබහින්න මගේ මිතුරු නාට්‍ය ශිල්පී වත්මන් ජ්‍යේෂ්ට කථිකාචාර්ය ප්‍රසන්නජිත් අබේසුරිය සොයුරාගේ මගපෙන්වීම මත ඒ රාජ්‍ය ළමා නාට්‍ය උළෙල තෝතැන්නක් බවට පත්කරගත්තා. ඒ “ඔක්කෝමල්ල කොල්ල කාලා” නාට්‍ය සමග. එතැනදී මා අත්විඳි, දැන උගත් කාරණාවක් තමයි ලාංකික අපේ ජනකොටස් මැදදි ළමානාට්‍යකරණය ළමුන් උදෙසා පමණක් නොවන වග. වැඩිහිටි ප්‍රෙක්ෂකයාටත් යම් හෙයකින් වින්දනය කළ හැකි ලෙස ළමා නාට්‍ය නිර්මාණය සිදුවිය



යුතු බව. ඒ ඇයි කියන කාරණාව වැඩිදුර කතා කරන්න අපි වෙනම කතාබහක් කලයුතුයි. නමුත් ඒ සටහන් කරපු විදියට ළමානාට්‍ය නිර්මාණය තුළ වැඩිහිටි රසවින් දනය ඉෂ්ට සිද්ද කරන්න මමත් යශෝධරත් අපේ හැම නිර්මාණයකම උත්සාහ කරනවා. ඒ නාට්‍ය ප්‍රේක්ෂකාගාරයේ පැවැත්ම ගැන පුළුල් බලාපොරොත්තු ඇතුව.
ඇතැමෙකුගේ අදහසක් තියනව වත්මන් තාක්ෂණික මාධ්‍යයන් හමුවේ නාට්‍ය කලාව, නාට්‍ය ප්‍රේක්ෂකාගාරය මියදෙමින් පවතින් නක් බව- එවැනි පසුබිමක් මත උනත් ලෝකේ පැරණිතම කලා මාධ්‍යයක් වෙන නාට්‍ය කලාව තවදුරටත් පවත්වාගෙන යන්න නාට්‍යකරුවෝ ලෝකේ පුරා තැනින් තැන විවිධ ආකාරයේ උත්සාහයන් වල නිරත වෙනව. මගෙත් යශෝධරාගේත් ජීවිත වල නාට්‍ය කලාවට වෙන්වෙලා තියෙන්නේ සුවිශේෂී ඉඩහසරක්. පුද්ගලිකත්වය සහ නාට්‍ය කලාව වෙන්කරගන්න බැරි තරමටම බද්ධවෙලා. මම එහෙම කීවේ අපි අපේ ජීවිත වලට, දරුවන්ගේ ජීවිත වලට අදාල තීන්දු තීරණ ගන්න හැම මොහොතකම නාට්‍ය කලාවට දෙන ප්‍රමුකත්වය ගැන ඔබට කියන්න. අපි ප්‍රචාරය නොකළට නාට්‍ය කලාව වෙනුවෙන් කරන කැප කිරීම් බොහෙ ාමයි. දාහත් වසරක් පුරාවේ (පස් වසරක් නවසීලන්තයේ වෙලිංටන් නුවර සහ අද දක්වා මෙල්බර්න් නගරයේ තැන් කිහිපයක) සතිපතා නාට්‍ය වැඩමුළු පවත් වාගෙන යනවා කියන එක ලෙහෙසි දෙයක් නෙවෙයි. අපි අපේ නාට්‍ය කලා අභ්‍යාසයේ දිගුකාලීන පැවැත්ම නිර්මාණය කරගන්නේ නාට්‍ය වැඩමුළු සංකල්පය ඇසුරෙන්.
ඇත්ත තත්ත්වය නම් කලාව ජීවිතයට අවශ්‍ය අංගයක් බවට පත්නොවූ බහුතර ජන සමාජයක් මැද අපි පොරබදනවා නාට්‍ය කලාව පවත්වාගෙන යන්න. මේ පොර බැදිල්ලේදී අපි අත්විදින දේවල ප්‍රථිපලයක් විදිහටත් ළමා නාට්‍ය කරණයේදී වැඩිහිටි ආමන්ත්‍රණය වැදගත් සාධකයක් බවට පත්වෙනවා. ඒ කොහොම උනත් නිර්මාපක විදියට මම හැම මොහොතකම උත්සාහ කරනව ළමා ප්‍රේක්ෂකයාට අසාධාරණයක් නොවෙන ලෙස වැඩිහිටි ආමන්ත්‍රණය සිද්ද කරන්න.

**වත්සලා : ප්‍රශ්ණය**



ඒ ගමනේ ඇරඹුම් ලක්ෂයක් ලෙස පුද්ගලිකව මට පෙනෙන්නේ, 2017 2018 වෙනුවෙන් ඔබ දෙපල නිර්මාණය කළ ‘විසිරා’ නාට්‍යයයි. සරල සුන්දර තේමාවක් ඔස්සේ ප්‍රේක්ෂකයාව රැගෙන යන අතරවාරයේ වක්‍රව යම් ගැඹුරු පණිවිඩයක් ඔහුගේ මනසට කා වද්දන්න ඔබ සුක්ෂම වුනා. ඒ ගැන අදහස් දැක්වීමක් කලොත්?

**කුසුම්සිරි : පිළිතුර**

ප්‍රේක්ෂිකාවක් විදියට ඔබට එහෙම හැගුන නම් ... ඔබ එසේ විශ්වාස කරනවානම් ... නිර්මාපක විදියට මම අහිංසක තෘප්තියක් බුක්ති විදිනවා.
අපි කළ නිර්මාණ සියල්ලක්ම එකිනෙකා වැලඳ ගන්නේ වෙනස් වෙනස් ආකාරයට. ඇතැමෙක් ආදරයෙන් නිර්මාණය පිළිග නිද්දී තවකෙක් ප්‍රතික්ෂේප කරන්න පුළුවනි. විවිධ හේතු කාරණා නිසා. මං හිතන්නේ සියල්ලෝ සතුටු වනසුලු නිර්මාණයක් ලෝකේ තවම බිහිවෙලා නෑ. ඒක තමයි ස්වභාවය. නමුත් මාත් යශෝධරත් සතුටු වන කාරණාවක් අපේ පසුගිය නිර්මාණ වැළඳගත් බහුතර ප්‍රේක්ෂකාගාරයක් මෙල්බර්න් නුවර සිටීම. එකී ප්‍රේක්ෂකාගාරයට අපට හැකි උපරිම සාධාරණය කරන්න අපි නිරන්තරයෙන් උත්සාහ කරන්නේ එය වගකීමක් ලෙසින්. ඒ වගේම සාදනීය ලක්ෂණ සමග නිර්මාණයන් විවේචනය කරන අයෙක් වෙතොත් පිළිගන්නෙත් ගරුසරුව.

**වත්සලා : ප්‍රශ්ණය**

“ටියුෂන් මැජික්,” සරලව ටියුෂන් ගැනද? බොහෝ දෙනෙක් එහෙම අහනවා.

**කුසුම්සිරි : පිළිතුර**

ඔබ මගෙන් අහන්න මැලි වෙන, ඒ බො

18 වන පිටට